## අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 2022

## 50 - නාට්‍ය හා රංගකලාව

## ලකුණු බෙදීයාම

I පත්‍රය

ලකුණු 1 ×40 = 40 කි.

II පත්‍රය

II පත්‍රය ප්‍රශ්න 07 කි. 01 වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ඉතිරි ප්‍රශ්න 06 යෙන් 04 ක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.

01 ප්‍රශ්නයට ලකුණු 12 කි.

- තෝරාගන්නා ඉතිරි ප්‍රශ්න 04 කට ලකුණු 12 × 04 = 48කි.

02 ප්‍රශ්නයට ලකුණු 12 කි.
03 ප්‍රශ්නයට ලකුණු 12 කි.
04 ප්‍රශ්නයට ලකුණු 12 කි.
05 ප්‍රශ්නයට ලකුණු 12 කි.
06 ප්‍රශ්නයට ලකුණු 12 කි.
07 ප්‍රශ්නයට ලකුණු 12 කි.

} ඕනෑ ම ප්‍රශ්න 04 ට ලකුණු 48 කි.

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | 40 |
| II පත්‍රයට ලකුණු | 60 |
| මුළු ලකුණු | 100 |

**විෂය අංකය - 50** **විෂයය - නාට්‍ය හා රංග කලාව**

**අ.පො.ස (සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 02**

**I පත්‍රය - පිළිතුරු**

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | **03** | 11. | **02** | 21. | **04** | 31. | **01** |
| 02. | **01** | 12. | **04** | 22. | **01** | 32. | **03** |
| 03. | **04** | 13. | **04** | 23. | **02** | 33. | **04** |
| 04. | **01** | 14. | **03** | 24. | **04** | 34. | **02** |
| 05. | **03** | 15. | **02** | 25. | **02** | 35. | **03** |
| 06. | **02** | 16. | **02** | 26. | **02** | 36. | **03** |
| 07. | **04** | 17. | **04** | 27. | **01** | 37. | **04** |
| 08. | **03** | 18. | **01** | 28. | **02** | 38. | **01** |
| 09. | **01** | 19. | **02** | 29. | **01** | 39. | **01** |
| 10. | **02** | 20. | **03** | 30. | **04** | 40. | **03** |

විෂය අංකය - 50 විෂයය - නාට්‍ය හා රංග කලාව

**අ.පො.ස (සා/පෙළ) පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 02**

**II පත්‍රය - පිළිතුරු**

01 i.පන්සිය පනස් ජාතකය, උම්මග්ග ජාතකය (ලකුණු 02 )

ii.දික්තලා හා කාලගෝල අතර (ලකුණු 02 )

iii.රම්බරී ය. (ලකුණු 02 )

iv.බුද්ධිමත් බව, අපක්ෂපාතී බව, තැනට සුදුසු තීරණ ගැනීම (ලකුණු 02 )

v.ගීත යොදා ගැනීම, රංගාලෝකය භාවිත හරහා වේදිකා පසුතල මැවීම, සංවාද මගින් හෙළි කිරීම, ආදී කරුණු දෙකක් සඳහන් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු 02 )

vi. • ජාතක කතාවේ දී මහෞෂධ පණ්ඩිතයන් දික්තලා කාලගෝලට අයිති බව තීන්දු කරයි. දික්තලා කාලගෝලට හිමි වේ. එහෙත් නාට්‍යයේ දී දික්තලාගේ ආදරය නොලැබීමෙන් ඇගෙන් පලක් නොවන බව වටහා ගත් කාලගෝල විසින් දික්තලාව දික්පිටියාට බාර කරයි.

- ජාතක කතාවේ චතතුදත්ත යන චරිතයක් නොමැත. එහෙත් නාට්‍යයේ චතතුදත්ත චරිතය යොදාගෙන ඇත.
- ජාතක කතාවේ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥා මහිමය වඩාත් ප්‍රදර්ශනය කරන අතර, නාට්‍යයේ කාලගෝලගේ චරිතය වඩාත් ඉස්මතු කරයි.
- දික්පිටියා ජාතක කතාවේ දී නිරූපණය වන්නේ කිසිදු රැකියාවක නිරත නොවන අයෙක් ලෙස ය. නාට්‍යයේ ඔහු බිලී බෑමේ රැකියාවේ නිරත වන පුද්ගලයෙකි.
- දික්පිටියා සහ දික්තලා ජාතක කතාවේ දී ගඟ මැද දී කතා බහ කළත් නාට්‍යයේදී ගඟෙන් එතෙර වී කතා බහ කරයි. ආදී කරුණු දෙකක් සඳහන් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 02 )

02. (I) රෝග නිවාරණය, යක්ෂ උපද්‍රවවලින් ආරක්ෂා වීම,සශ්‍රීකත්වය (ලකුණු 02 )

(ii) සංඛපාල රජු පිළිබඳ කතා පුවත හෝ දං උදියාගේ කතාව විස්තර කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04 )

(iii) අන්තර් රංග අවස්ථා,

සූනියම් යක්ෂණියගේ ත්‍රිවේෂාවේශය, පැදුරේ දැපවිල්ල හා මරුවා පැමිණීම, පාලි පැමිණීම, සන්නි යකුන් පැමිණීම, මහාකෝළ සන්නි යකාගේ පැමිණීම. ආදී අන්තර් රංග අවස්ථාවක් නම් කොට ඒවා තුළ දක්නට ලැබෙන අනුකරණය, සමාරෝපය, අභින භාවිතය, රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, සංවාද භාවිතය, කවි ගීත ගායනා, රංග භූමිය, චරිත නිරූපණ, ප්‍රේක්ෂක සහභාගීත්වය, රංග සංගීත භාණ්ඩ භාවිතය ආදී කරුණු තුනක් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 06)

03. (I) රංගාලෝක පහන් - ධාරාලෝක පහන, යොමු පහන, අල්ට්‍රා වයලට් පහන, ස්ට්‍රොබ් පහන, ආලෝක බුබුළු පෙළ

රංගාලෝක උපකරණ - ඩීමරය, වර්ණ චක්‍රය, ප්‍රයෝග ප්‍රක්ෂේපක දර්ශකය, බබල් මැෂින්, මිරර් බෝල්, (ලකුණු 02 )

(ii) අතීතයේ රාත්‍රී කාලයේ පැවැත් වූ ශාන්තිකර්ම අභිචාරකර්ම සඳහා සඳ එළිය ද, දිවා කාලයේ හිරු ආලෝකය ද යොදාගෙන තිබේ. පසුව ශාන්ති කර්ම ගැමි නාට්‍ය ආදිය සඳහා ගිනිමැල ආලෝකය ද, පන්දම්, විලක්කු, කොප්පරා, දුම්මල කිරි ගැසීම් වැනි ආලෝක ප්‍රභවයන් ද භාවිත කර ඇත. පසුකාලීනව කිට්සන් පහන්, ගෑස් ලාම්පු ආදිය භාවිත කර ඇති අතර, විදුලි බුබුල නිපදවීමත් සමග විදුලි ආලෝකය රංගාලෝකය සඳහා භාවිත වී ඇත.

(ලකුණු 04 )

(iii) වේදිකාවේ අඳුර පලවා හැරීම, සමූහයක් අතුරෙන් පුද්ගලයෙක් විශේෂ කොට දැක්වීම, විශේෂ කාර්යයන් හුවා දැක්වීම, නාට්‍ය අවස්ථා තීව්‍ර කිරීම, වේදිකා පසුතල මවා පෑම, පරිසරය හුවා දැක්වීම, සියුම් රංගන අවස්ථා කෙරෙහි අවධානය යොමු කිරීම, කාලය හැඟවීම, වේදිකාවේ ගැඹුර දැක්වීම, ජවනිකා මාරු කිරීම, ක්ෂණිකව වර්ණ වෙනස් කිරීම, නාට්‍ය ආරම්භය හා අවසානය සනිටුහන් කිරීම, භාෂාවක් ලෙස භාවිත වීම.

(ලකුණු 06 )

04. (I) බී.ඒ.ඩබ්ලිව්.ජයමාන්න. (ලකුණු 02 )

(ii) අනුවර්තන

- සුගතපාල ද සිල්වා - හරිම බඩු හයක්, හිත හොඳ අම්මණ්ඩි
- ධම්ම ජාගොඩ - වෙස් මුහුණු
- බන්ධුල ජයවර්ධන - බෙර හඬ, සකල ජන
- ගුණසේන ගලප්පත්ති - මුහුදු පුත්තු
- බන්දුල විතානගේ - රෝමය ගිනි ගනී
- හෙන්රි ජයසේන - අහස් මාලිගා
- රංජිත් ධර්මකීර්ති - මහ ගෙදර

පරිවර්තන

- හෙන්රි ජයසේන - හුණුවටයේ කතාව
- සුගතපාල ද සිල්වා - හෙලේ නැංග ඩෝං පුතා
- බන්ධුල ජයවර්ධන - කඹය
- බන්ධුල විතානගේ - වැනීසියේ වෙළෙන්දා
- ආරියවංශ රණවීර - ඊඩිපස් රජ, ඇන්ටිගනී
- සුනන්ද මහේන්ද්‍ර - සයුරෙන් ආ ළඳ, ජන හතුරා
- රංජිත් ධර්මකීර්ති - හිරු නැති ලොව

ආදී නාට්‍යකරුවන් හා නාට්‍ය සඳහන් කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04 )


(iii) • කිසියම් නාට්‍ය කෘතියක කතා වස්තුව, මුඛ්‍යාර්ථය, චරිත, ස්ථාන නාම ආදිය වෙනස් නොකොට භාෂාව පමණක් වෙනත් භාෂාවකට පෙරළීම **'පරිවර්තනයක්'** බවත්,

මුල් කෘතියේ එන චරිත හා ස්ථාන නාම වෙනස් කරමින්, මුලික සිද්ධිය උකහා ගෙන පරිසරයට ගැළපෙන ආකාරයෙන් සකස් කරනු ලබන කෘතිය '**අනුවර්තනයක්**' බවත්,

ඓතිහාසික, සාහිත්‍ය හෝ ජනවේදයේ එන කතාවක් හෝ සමාජ සංසිද්ධියක් තේමා කොටගෙන තමන් විසින් ම කරනු ලබන නිර්මාණය '**ස්වතන්ත්‍ර**' කෘති ලෙසත් දක්වා පිළිතුර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(ලකුණු 06 )

05. (I) ගෘහස්ථ රංග භූමිය හා එළිමහන් රංග භූමිය. (ලකුණු 02 )

(ii) 09 යි.




| | |
|---|---|
| 1 | ඉහළ දකුණ / උඩ දකුණ |
| 2 | ඉහළ මැද / උඩ මැද |
| 3 | ඉහළ වම / උඩ වම |
| 4 | මැද දකුණ |
| 5 | මැද |
| 6 | මැද වම |
| 7 | පහළ දකුණ /යට දකුණ |
| 8 | පහළ මැද / යට මැද |
| 9 | පහළ වම / යට වම |

- ඉහත හැඩයෙන් රංග භූමිය ඇඳ කොටස් නම් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු 04 )

(iii)

- නළු නිළියන් වේදිකාවේ නිවැරදිව ස්ථානගත කිරීම, හේතුඵල සම්බන්ධතාව රැකෙන ලෙස සිදු කිරීම
- පසුතල ස්ථානගත කිරීමට වඩාත් සුදුසු වේදිකා කොටස් යොදා ගැනීම
- පැති තිර රංග කාර්යයට ඉවහල් වන පරිදි යොදා ගැනීම
- රංග භූමියේ සමබරතාව පවත්වා ගැනීම
- රංග භූමියේ රංගාලෝකය ප්‍රධාන වශයෙන් පතිත වන ස්ථාන පිළිබඳ අවබෝධයෙන් නළුනිළියන් මෙහෙයවීම. රංග භූමියට ප්‍රවේශවීම හා පිටවීම ද ඊට අදාළ දිශාවන් පිළිබඳව ද අවධානය යොමු කිරීම

ආදී කරුණු තුනක් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු 06 )

06. (I) පරාක්‍රම නිරිඇල්ල (ලකුණු 02)

(ii) සෙක්කුව, විනිශ්චය, ගැලීලියෝ, උත්තමාවී, වරෙන්තු,

එච්. ඒ. පෙරේරා සමග සම්බන්ධ වෙමින් ජනකරළිය ජංගම රඟමඬලේ නිර්මාණය වූ නිර්මාණ ලෙස,

අන්දර මල්, සීතම්බර පට, මකරරාක්ෂ, වරන්දාස්, මැටි කරත්තය, කල්පාන්තය (ලකුණු 04 )

(iii) නාට්‍ය රචකයෙක් මෙන් ම නාට්‍ය අධ්‍යක්ෂකවරයෙක් බව,

පරිවර්තන නාට්‍ය ද සිදු කළ නිර්මාණකරුවෙක් බව,

ලංකාවේ නාට්‍ය කලාවේ සම්මත රංගන ක්‍රමය වෙනස් කර ජනකරළිය රඟ මඬල ආරම්භ කිරීම.

ගාමිණී හත්තෙට්ටුවේගම සමග මූලික වී විදී නාට්‍ය කලාව ආරම්භ කිරීම.

නවක ශිල්පීන් රැසක් ක්ෂේත්‍රයට දයාද කිරීම.

නාට්‍ය කෘති රචකයෙක් වීම.

ආදි කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

07) ප්‍රශ්නයට අදාළව පසුබිම, කාලය හා චරිත ගොඩනගමින් රංග විධාන හා සංවාද සහිතව චරිත අතර ගැටුමක් මතු වන අයුරින් දෙගිඩියාව කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා ගොඩනගා තිබීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව,

(I) රංග විධාන සහිත සංවාද ගොඩනගා තිබීම (ලකුණු 04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් පෙළ සකස් කිරීම (ලකුණු 04)

(iii) දෙගිඩියාව කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කර තිබීම

(ලකුණු 04)

ප්‍රශ්න 2 සිට 6 දක්වා පිළිතුරු සැපයීමේ දී iii කොටසට සම්පූර්ණ ලකුණු ලබා දීමට නම් අවම වශයෙන් කරුණු තුනක්වත් විස්තර කිරීම අපේක්ෂා කෙරේ

ඬජඬවඉ